විටෙක එතුමන්ගේ හඬ හැඟුම්බරය. තවත් විටෙක ඒ හඬ තීරණාත්මකය. නොසැලෙන අදිටන ඒ හඬෙහි ගැබ්ව ඇත. කිතුණුවන්ගේ පමණක් නොව නොකිතුණුවන්ගේ සිත්වල පවා එතුමන්ගේ ගාම්භීර හඬ පැලපදියම් වන්නේය. එදිනෙදා ජීවිතයෙන් උකහා ගත් අත්දැකීම් තුළින් දෙවියන් අත් දකින්නට අපට දිරිදෙන එතුමන්ගේ කියමන් ඉතා සරලය. එහෙත් ඉන් අප ලබනා දැනුම් සම්භාරය නිම කළ නොහැකිය.

මඩු වන්දනා බිම අපට අහිමි වූ තැන් පටන් කතෝලිකයන් ගේ ජන වන්දනා පුදබිම් වූ තේවත්ත, බැසිලිකාව, තලවිල, ශාන්ත ආනා පුදබිම තුළ ඒක රාශී වන ජනී ජනයාගේ සවන් එතුමන්ගේ අරුත් බර වදනින් ප්‍රබෝධ වන්නේ එය අප දෙවියන්ගෙන් ලැබූ භාග්‍යයකටම වන්නේය.



# අති උතුම්
# ප්‍රෑන්ක් මාකස්
# රදගුරු හිමිපාණෝ

## *50 වසරක පූජක දිවිය පිළිබඳ සටහනක්*

වික්ටෝරියාවට පැමිණෙන අති උතුම් ප්‍රෑන්ක් මාකස් ප්‍රනාන්දු රදගුරු හිමිපාණන් මෙහි සිටින කාලය තුළ අපගේ ආත්මික ජීවිතයේ උන්නතිය වෙනුවෙන් කැපවී කටයුතු කරන්නට බලාපොරොත්තු වන්නේය.

එලාරිස් ප්‍රනාන්දු මහතා සහ මේරි බ්‍රිජට් ප්‍රනාන්දු මහත්මියගේ සිව්වන දරුවා ලෙස 1931 ඔක්තෝම්බර් මස 19 දින මෙලොව උපන් ප්‍රෑන්ක් මාකස් පදවි පියාණන් හට රෙජිනෝල්ඩ්, ජෝසෆ් සහ ෆිලමින් යන වැඩිමල් සොයුරන් දෙදෙනකු හා වැඩිමල් සොයුරියක්ද, ක්වීන්ටස්, ෆීලිෂියා, අර්වින් යන බාල සොයුරන් දෙදෙනකු හා බාල සොයුරියකුද විය. කටුවපිටිය රෝමානු කතෝලික විදුහලේ සහ මීගමුවේ මාරිස්ටෙලා විදුහලේ උගෙනුම ලැබූ මෙතුමන් ශා. ඇලෝසියස් කණිටු දෙව්සත්හලෙන්ද, ශාන්ත බර්නාඩ් දෙටු දෙව්සන් හලෙන්ද, රෝමයේ ඡරදවිට්බෝ තසාැ විශ්ව විද්‍යාලයෙන් දර්ශන විද්‍යාව, දේව ධර්ම ශාස්ත්‍රය හදාරා දෙවියන් වහන්සේට සේවය කරනු පිණිස පූජක දිවිය තෝරාගෙන 1956 දෙසැ. 22 දා රෝමයේදී පූජක පදවිය ලැබීය. ඉන් අනතුරුව 1957 සිට 1960 දක්වා කොළඹ සාන්ත පීතර විදුහලේ ගුරු පියෙකු ලෙස සේවය කළ මෙතුමන් 1960-1961 කාල වකවානුව තුළ -ඥානාර්ථ ප්‍රදීපය" පත්‍රයේ සංස්කාරක වශයෙන් කටයුතු කළේය.

ඉන්පසු 1961-1965 කාල වකවානු තුළ ශාන්ත ඇලෝසියස් කණිටු දෙව්සන් හලේ අධ්‍යක්‍ෂක වශයෙන් කටයුතු කළ අතර 1965 ජූලි 06 වන දින කොළඹ අග රදගුරු හිමිපාණන්ගේ සහායක පදවියට පත්විය. 1965 අගෝස්තු 19 දින කොටහේන සාන්ත ලූසියා ආසන දෙව්මැදුරේදී කොළඹ අගරදගුරු අති උතුම් තෝමස් කාදිනල් කුරේ නි.ම.නි. හිමිපාණන් විසින් එතුමන් හට රදගුරු අභිෂේකය ප්‍රදානය කරන ලදී. 1968 වනතෙක් එම ධූරයේ කටයුතු කරන ලදී. ඉන්පසු නිලලත් සහාය රදගුරු පදවී ලබා 1968 සැප්. 06 වන දින හලාවතට පැමිණීමෙන් පසු 1972 දෙසැ. 27 වන දින හලාවත පදවියේ කිතුනුවන්ගේ ආත්මික නියමුවාණන් ලෙස විශාල කාර්යභාරයක් ඉටු කළ අතර මේ දක්වාද ඒ මෙහෙවර හමාර කර නොමැත.

හලාවත පදවි පාලනය සඳහා පූජක සෙනෙට් සභාව පිහිට වූ අතර දෙවන වතිකාන මන්ත්‍රණ සභාවේ නිර්දේශ අනුව සභාව තුළ ගිහි සහභාගීත්වය ඇති කිරීමට සෑම මීසමකින්ම සාමාජිකයින් දෙදෙනෙකු බැගින් තෝරා ගෙන ගිහි දුක සේවාව සඳහා ශාසන සමුළුව නම් මණ්ඩලයක් පිහිටුවා ගිහි දායකත්වය සභාවේ කටයුතු තුළ අවධාරණය කරන ලදී. සෑම මීසමකම මීසම් සේවක මණ්ඩලල සහ ජන වන්දනා කමිටු පිහිටුවන ලදී. පදවි ජන වන්දනා කමිටුව මගින් මීසම් ජන වන්දනා කමිටු පෝෂණය කරන අතර දේව වචනය ප්‍රකාශ කිරීමට සැදැහැවතුන් පුහුණු කිරීම වැනි දෑ පදවි ජන වන්දනා කමිටුව මගින් කිරීමට පියවර ගන්නා ලදී.

සිංහල සංස්කෘතික කිතුණුවන් තුළ වැඩි වර්ධනය කිරීමේ අභිලාෂයෙන් නැටුම් ගැයුම් නාට්‍ය අනුසාරයෙන් දහම් පණිවිඩය ලෝකයට දීමට තලෙන්තු පිරි අය දිරි ගැන්වීමට හලාවත පදවි සංස්කෘතික කමිටුව (හපසංක) පිහිටුවන ලදී. සුදසුන ශාලාව තනාදීමෙන් කලාකරුවන් දිරිගන්වන ලදී.

සාමාජීය අසාධාරණය ඉදිරියේ ජනතාවට යුක්තිය ඉටු කරදීමට තනිව නැගී සිටීමට නොහැකි පීඩිත ජනතාව සමඟ සිට ඔවුන් වෙනුවෙන් පෙරමුණ ගනිමින් බොහෝ දෙනාගේ ප්‍රසාදයටත් එමෙන්ම විරුද්ධ මතවාදීන්ගේ අප්‍රසාදයට ද ලක්වූවද එතුමන්ගේ ස්ථාවරය අදටත් එසේමය.

ඇමෙරිකන් හඬ සම්ප්‍රේශණාගාරයට විරුද්ධව නැගූ හඬ මගින් දිළිඳු ධීවරයන්ට අහිමි වෙන්නට තිබූ බිම් කොටසින් වැඩි කොටසක් ජනතාවට උරුම කර දෙන්නට හැකි විය. එසේම හලාවත පදවි පියාණන් ගල් අඟුරු තාප බලාගාරයක් නොරොච්චෝලේ ඉදිකිරීම ගැන විරෝධය දැක්වූයේ අග්‍රඝණයේ පරිසරවේදීන්, විද්‍යාඥයින්, ඉංජිනේරුවන්ගෙන් ගත් උපදෙස් මතය. එතුමන් දැක්වූ එම විරෝධය හලාවත පදවියේ රදගුරුතුමන් ලෙස ඓතිහාසික පුදබිමක් ආරක්‍ෂා කරගනු වස් විදහා පෑ ඉතා සාධාරණ විරෝධයක් ලෙස මම දකිමි.

ලාංකීය කිතුණුවන්ගේ අනන්‍යතාවය රැක ගැනීම වස් හලාවත පදවි පියාණන් මෙම බලාගාරය නොරොච්චොලේ ඉදිකරනවාට පෑ විරෝධය නිසා විරුද්ධමතවාදීන් අතර අප්‍රසාදයට ලක්වූ නමුදු සාන්ත ආනා මව්තුමියගේ පිහිට පතා තලවිල පුදබිමට එන දහස් සංඛ්‍යාත බැතිමතුන් හලාවත පදවි පියාණන් ඒ පූජනීය බිම රැකගන්නට පෑ විරෝධය ගැන නිති ස්තුතිවන්ත වනු ඇත. මෑත ඉතිහාසයේ ආගම් පනත තුළින් කිතුණුවාට සිදුවන අසාධාරණභාවය ලොවට හඬ ගා කියන්නට පුරෝගාමී වූ හලාවත පදවි පියාණන් අසන ප්‍රශ්ණයේ සාධාරණ අසාධාරණ භාවය කෙතරම්ද කියා මනින්නට හැකි වන්නේ මව්බිමෙන් බැහැරව ඔස්ට්‍රේලියාවේ වෙසෙන ලාංකීය අපට ඕස්ට්‍රේලියානු රජයේ අනුග්‍රහය ඇතුව සිය ආගම් ඇදහීමේ හා ප්‍රචාරය කිරීමේ අයිතිය ලංකාවේ පැනවීමට යන ආගම් පනත හා සසඳා බලන විටය.

සත්‍යයට සාක්ෂි දැරුමට හා මානව දයාව පෙරදැරි කරගෙන ජේසුතුමන් අත් දකිනට අප යන මේ ගමන තුළ ලාංකිය කිතුණුවාගේ ආත්මීය පෝෂණයට කැපවූ මේ පදවි නියමුවානන් කළ මෙහෙවර මෙසේ කියා නිම කළ නොහැකිය. උන්වහන්සේගේ ක්‍රියාවන් තුළින් මා දුටු ස්ථිර සාර භාවය දේව ගැති භාවය, ලාංකිය කිතුණුවාට එතුමන් මහා යුග පුරුෂයකුම වන්නේය. එතුමන්ගේ 50 වසරක සේවයට සියළු කිතුණුවන් වෙනුවෙන් මගේ ප්‍රණාමය පුද කරන අතර එතුමන් හට ශුද්ධාත්මයානන්ගේ මඟ පෙන්වීම නිති ලැබේවායි යදිමි.

**ශිරෝමා ප්‍රනාන්දු**




## දෙමංසල අබියස

මවර 2006 බක්මහ රංගන වෙනුවෙන් සිංහල සංස්කෘතික හමුව නවතම ප්‍රසංගයක් ඔබහට ඉදිරිපත් කිරීමට සුදානම්ව සිටී. දෙමංසල අබියස නමින් නම් කර ඇති මෙයට ශ්‍රී ලංකාවේ සිට භාතිය සන්තුෂ් ගායක දෙපළ හා ජනප්‍රිය නළු ජැක්සන් ඇන්තනි සහ ඔහුගේ පුත්‍ර සහභාගි වීමට නියමිතය. විශේෂයෙන්ම මෙරට වෙසෙන ශ්‍රී ලාංකික තරුණ පරපුරු ප්‍රේක්‍ෂකාගාරයට කැඳවීමේ අරමුණින් සංවිධානය කර ඇති මෙම ප්‍රසංගය නැවුම් ආරකින් යුතුව, උසස් වින්දනයක් ගෙන දෙන කාටත් සතුටින් නැරඹිය හැකි ප්‍රසංගයක් බව සංවිධායක මණ්ඩලය සන්නසට දන්වා සිටි. මෙය පැවැත්වෙන්නේ කාසල් හිල් හි හිල් සෙන්ටර් රංග ශාලාවේ වන අතර වැඩි විස්තර සඳහා මහේෂ් බණ්ඩාර 0412386472 අමතන්න.

## රෝහණ වීරසිංහගේ 35 වසරක සංගීත දිවියට උපහාර

සිඩ්නි නුවර කිත්සිරි කරුණාරත්නගේ සංවිධායකත්වයෙන් යුතුව ශ්‍රී ලංකාවේ අග්‍රගන්‍ය සංගීත ශිල්පී රෝහණ වීරසිංහයන්ගේ 35 වසරක සංගීත දිවියට උපහාර පිණිස පැවැත්වෙන සංගීත ප්‍රසංගයක් සිඩ්නි නුවර ඔපෙරා රඟහලේ දී පැවැත්වීමට කටයුතු යොදා ඇත. රෝහණ වීරසිංහයන් විසින් එදා මෙදාතුර තනු හා සංගීතය සපයන ලද පැරණි මෙන්ම නව පරපුරේ ගායක ගායිකාවන් 30 ක් පමණ මෙම ප්‍රසංගයට සහභාගි වීමට නියමිතය. 2006 මැයි මස 21 දා මෙම ප්‍රසංගය පැවැත්වෙයි. වැඩි විස්තර සඳහා කිත්සිරි කරුණාරත්න අමතන්න.

## අළුත් අවුරුදු උළෙල රෝස්ලි හිදී

මෙවර සිංහල අළුත් අවුරුදු උළෙල සිඩ්නි නුවර සියලුම සංගම් එකමුතුව රෝස්ලී ප්‍රජාශාලාවේදී පැවැත්වීමට කටයුතු සලසා ඇත. අවුරුදු චාරිත්‍ර වාරිත්‍ර හා අවුරුදු ක්‍රීඩා රැගත් මෙම උළෙලට සිඩ්නිවාසී ශ්‍රී ලාංකික ප්‍රජාවට සහභාගි වන මෙන් සිංහල සංස්කෘතික හමුව ඇතුළු අනෙකුත් සංගම් සාදරයෙන් ඇරයුම් කර සිටි.

# කැරොල් ග්‍රේෂස් ගේ මෝස්තර දැක්ම

## *නිරූපිකාවන්ට ඇඳුම් ඇන්දවීමේදී උපරිම ප්‍රවේසමකින් කටයුතු කළ යුතුය*

-කැරොල් මාරියා ග්‍රේෂස්" ඉන්දීය මෝස්තර ලෝකයට මිනි කැටයක් බඳුය. මෝස්තර නිරූපිකාවක් ලෙස ඈට ඇති ඉල්ලුම සුලුපටු නොවේ. එහෙත් දැන් ඒ මිනි කැටයේ පළුද්දක් හටගෙන තිබේ. එය කැරොල්ගේ වරදක්ද වෙනත් අයෙකුගේ වරදක්දැයි තවමත් පැහැදිලි නැත. එහෙත් ඒ වරද මුම්බායි නගරයම දෙදරවන්නට තරම් බලවත් වී තිබේ. වරද කොතැනදැයි පැහැදිලි නැතත් ඒ ගැන සොයන්නට ලක්මී මෝස්තර සතියට යා යුතුය. එහි පළමු දිනය බොලිවුඩ් තරු වැස්සකින් ආලෝකමත් විය. දෙවන දිනය කැරොල්ගෙන් ආලෝකමත් කිරීම සංවිධායකයින්ගේ බලාපොරොත්තුව විය. ඇය වෙනුවෙන් ඇඳුම් නිර්මාණය කළේ බෙන්නු සාගල්ය. එය ලක්මී මෝස්තර උළෙලක බෙන්නුගේ ඇඳුම් මෝස්තර දැක ගන්නා මුල්ම වතාවය. ඇය කැරොල් ග්රේෂස්ව හරි හරියට හැඩ කළාය. අවසානයේදී රන් පැහැ ලෝගුවක්ද කැරොල් වටා දැවටිනි. දැන් නිරූපිකාවන්ගේ වාරයයි. ප්‍රේක්‍ෂකයින්, මාධ්‍යවේදීන්, කැමරා ශිල්පීන් හමුවන අවස්ථාවයි. අනෙකුත් නිරූපිකාවන් මෙන්ම කැරොල් ද වේදිකා ගතවිය.

ඇය තම රන් පැහැ ලෝගුව ඉවත් කොට අනෙකුත් ඇඟළුම් ප්‍රේක්‍ෂකයින් හමුවේ දැක්වූවා පමණි. හදිසියේම ඇයගේ උඩුකය නිරාවරණය විය. ඉන් බලවත් අපහසුතාවයකට පත්වුණාද ඒ බවක් නොපෙන්වූ කැරොල් ආපසු විවේකාගාරයට පා තැබුවාය. එහෙත් ඒ වනවිටත් නූතන කැමරා ශිල්පීන් සිද්ධිය ජාත්‍යන්තරයට ගෙන ගොස් හමාරය. සමහර ප්‍රේක්‍ෂකයින් නම්, කැරොල්ට සිදුවූයේ අත්වැරැද්දක් යැයි නොදැන අත්පුඩි ආචාරයක්ද පුද කළහ.

සිදුවීම එතකින් අහවර නැත. එය දේශපාලන කුණාටුවක් බවට පත්වී තිබේ. මහාරාශ්ට්‍ර ප්‍රාන්තයේ මහ ඇමැතිවරයා, සිද්ධිය ගැන විශේෂ පරීක්‍ෂණයකට නියෝග නිකුත් කොට ඇත. පරීක්‍ෂක නිලධාරීන් දිවා රෑ නොබලා එහි වීඩියෝ පටය නරඹමින් සිටී. ඒ එය සත්‍ය වශයෙන්ම අත්වැරදීමක්ද එසේත් නැත්නම් පුළුන් මාධ්‍ය අවධානයක් සඳහා කළ මවාපෑමක් දැයි තහවුරු කර ගැනීමටය. මහ ඇමැතිවරයා නම් පවසන්නේ -ලක්මී" සංවිධානයකයින්ට නොවරදවාම දඬුවම් කරන බවයි.

මේ අතර කැරොල්ට වූ අවමානය ගැන නොයෙකුත් විවේචන එල්ල වෙමින් පවතී. සමහර මෝස්තර නිර්මාණ ශිල්පීන් පවසන්නේ මෙවැනි අත්වැරදීම් බටහිර ලෝකයේ නම් බහුල බවයි. සමහර නිරූපිකාවන් මාධ්‍යයට සහ ප්‍රේක්‍ෂකයින්ටද චෝදනා කර සිටී. ඔවුන් පවසන්නේ මෙම සිද්ධියත් ඉන්දියානුවන්ගේ අපරිනත බව පෙන්නුම් කෙරෙන බවයි.

කෙසේ වෙතත් කැරොල්ටත් වඩා මෙම සිදුවීමෙන් පීඩාවට පත් පිරිසක් සිටී. ඒ ඉන්දියානු සමාජ ශාලාවල නර්තන ශිල්පිනියන්.

දේශපාලන බලපෑම් නිසා එම සමාජශාලා වසා දැමීමෙන් ඔවුන්ගේ රැකියා අහිමි වී තිබේ.

කැරොල් මුහුණ පෑ තත්ත්වයටත් පරාජය කළ අවස්ථාවක් මෑතකදීද සිදුවී තිබේ. ඒ හිටපු ඉන්දීය රූ රැජිණක් වන ගාහර් බ්‍රාන් හැඳ සිටි ලිහිල් ගවුම ඇයටද නොදන්වා ඇඳ වැටීම නිසයි. එය අහම්බයක් දැයි සැක සිතෙන්නේ එම උළෙලටම එක්වූ අයිස්ලන්ත මෝස්තර නිරූපිනියකටද එම ඇබැද්දියම සිදුවීම නිසයි.

කෙසේ වෙතත් මේ සියලු කරුණු කාරණා මැද ඉන්දීය මෝස්තර නිර්මාතෘවේදීන් එක් තීරණයකට එළඹ තිබේ. ඒ නිරූපිකාවන්ට ඇඳුම් ඇන්දවීමේදී උපරිම ප්‍රවේසමකින් කටයුතු කිරීමටයි.

මිහිර මනුස්ත